# ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් සියඹලාගස් වැව තෙළිඟු ගම්මානයේ අහිකුණ්ඨක ජනතාව මුහුණ දෙන ආර්ථික හා සමාජ ගැටළු පිළිබඳ අධ්‍යයනය

කේ.එම්.ජී.එන්.කාවින්ද
ඒ.එම්.ජේ. ප්‍රේමතිලක

සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

**ප්‍රමුඛ පද:** අහිකුණ්ඨකයන්, තෙළිඟු, ආර්ථික, සමාජ, ගැටළු

## හැඳින්වීම


ලෝකය මානවයා සමස්තයක් වශයෙන් ගත්කල සංචාරක සත්වයෙකි. ලෝකය පුරාම මිලියන 11 පමණ සංචාරක ජීවිතයක් ගත කරන්නන් වන අතර එක්සත් රාජධානිය තුල මිලියනයක් පමණ සංචාරය කරමින් ජිවත් වන්නන් වෙති."Times" සඟරාවට අනුව මොවුන් Roma හෝ Romaniයන නම්වලින් හඳුන්වනු ලැබේ.ශ්‍රී ලංකාව තුල ජිවත් වන ඉන්දියානු සම්භවයක් සහිත සංචාරය කරමින් ජිවත් වන මානව කොට්ඨාශය අහිකුණ්ඨකයන් ලෙස හඳුන්වනු ලබයි.තෙළිඟු භාෂාව කථා කරන බැවින් ශ්‍රී ලංකාව තුල තෙළිඟු වැසියන් ලෙස ද හඳුන්වන මොවුන් තෙළිඟු භාෂාවට අමතරව පොදුවේ ද්‍රවිඩ භාෂාව ද ව්‍යවහාර භාෂාව ලෙස යොදා ගනී. මෙම අහිකුණ්ඨක ජනතාව පුරාතන කාලයේ සිටම පොදු සමාජයෙන් හුදෙකලාව ජිවත් වන සමාජ කොට්ඨාශයක් වේ.ශ්‍රී ලංකාව තුල වැද්දා ලෙස හඳුන්වන ආදිවාසී අපගේ ජන කොට්ඨාශයට පසුව සිටින ඓතිහාසික වශයෙන් හුදෙකලා වූළුමෙන්ම බොහෝමයක් අස්පර්ශිත උරුමයන්ගෙන් සමන්විත ජන කොට්ඨාශයක් වන්නේ මෙම අහිකුණ්ඨක ජනතාවයි.සංචාරයේ යෙදෙමින් ජිවත් වූ මෙම අහිකුණ්ඨක ජනතාවට ස්ථිර පදිංචිය සඳහා වාසස්ථානයක් නොවූ හෙයින් විවිධ කාල වකවානු වලදී විවිධ රජයන් හා සංවිධාන විසින් වෙනම ගම්මාන පිහිටුවා මෙම පිරිස් පදිංචි කරවා ඇත .

උතුරු මැද පළාතට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියඹලාගස්වැව තෙළිඟු ගම්මානය එවැනි තවත් එක් ගම්මානයකි.පවුල් 50ක් පමණ ජිවත් වන මෙම තෙළිඟු අහිකුණ්ඨක වැසියන්ගේ ප්‍රධාන ජීවන උපාය වන්නේ සාස්තර කීම, නයි නැටවීම, රිලවුන් හා සුනඛයින් යොදා ගෙන රංගනයන් ඉදිරිපත් කිරිමහා හඳුන්කුරු විකිණීමයි.

බාහිර සමාජයේ දිගු කාලීන විකාශනය බලන විට දකිනට ලැබෙන දියුණුව, සංස්කෘතික විකාශනය සැළකිය යුතු තරමකින් වත් මෙම අහිකුණ්ඨක සමාජය තුල දක්නට නොමැත.

## ක්‍රමවේදය

මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනයන් තුළින් තොරතුරු ලබා ගත් අතර මූලාශ්‍ර අධ්‍යයනය තුළින් ද්විතික දත්ත හා ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් ප්‍රාථමික තොරතුරු අත්පත්කර ගැනින. ප්‍රාථමික දත්ත මුළුමනින්ම සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ලබාගැනීම කරන ලදී.




## ප්‍රතිඵල හා සාකච්ඡාව

සියඹලාගස්වැව තෙලිඟු ගම්මානය එකම කර්මාන්තයේ නියුක්ත එකම සංස්කෘතියකින් හෙබි මිනිසුන් කොට්ඨාශයකින් සැදුම්ලත් අභිකුණ්ඨක ගම්මානයකි. මොවුන් මුහුණ දෙන ගැටුළු ප්‍රධාන වශයෙන්ම ආර්ථික හා සමාජ ගැටළු වශයෙන් කොටස් කළ හැක.

මෙම පිරිස සංචාරයේ යෙදෙමින් ජීවත් වන පිරිසක් වන බැවින් මෙම ගම්මානයේ යෙදෙන කිසිම පුද්ගලයෙකුට ස්ථිර රැකියාවක් නොමැත.එය එදිනෙදා ආර්ථිකයට දැඩිසේ බලපානු ලබයි. පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ සේවය කරන කිසිඳු පුද්ගලයෙකු මෙම ගම්මානය තුල දැකගත නොහැක.ගමේ සිටින 90% පමණ කාන්තාවන් ද තම පවුලේ ආර්ථික කටයුතු සඳහා සාස්තර කීමේ කාර්යයයේ නිරත වේ. වැඩිහිටි කාන්තාවන් සාස්තර කීමේ නිරත වීමේ දී කුඩා ළමුන් සිඟමන් යෙදීමේ නිරත වේ. මේ තුළින් ලබන මුදල් හා පිරිමි පාර්ශවය විසින් උපයන ආදායම සමස්ථ පවුලේ ආර්ථික කටයුතු සඳහා දායක කර ගනී. පාරම්පරිකව ලැබුවා වූ සාම්ප්‍රදායික කර්මාන්තයට අමතරව වෙනත් බාහිර ආර්ථික කටයුත්තක නිරත නොවන බැවින් ආදායම් වශයෙන් මෙම ජනතාව ලබනුයේ සාම්ප්‍රදායික කර්මාන්තයෙන් ලබන ආදායම පමණි. මෙම ආර්ථික කටයුතු වලින් ලබන ආදායම වර්තමානයේ ඔවුන්ගේ පාරිභෝජන කාර්යයන් සපුරා ගැනීම සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවේ.එමෙන්ම සාම්ප්‍රදායික කර්මාන්තය තුල ද ශිල්පීය ක්‍රම භාවිතය ගැන පුහුණුවක් නොවීම ද එම කාර්යයන් නියාමනය සඳහා නියාමනයකු නොමැති වීමද මොවුනට පවතින තවත් ගැටළුවකි. තම අභිකුණ්ඨක කණ්ඩායම තුළ නායකයකු සිටිය ද ඔහු තුළ පවතින අවම ශිල්පීය දැනුමත් නියාමන දුර්වලතාවයන් තව තවත් මෙම ජන කොට්ඨාශයේ සාම්ප්‍රදායික කර්මාන්තය ආර්ථික වශයෙන් අවාසි සහගත වීමට දායක වී ඇත. ජනතාව බහුල ස්ථාන වල ජීවිකාව කරගෙන යාමේ දී ස්ථාවර ස්ථානයක් නොමැති බැවින් බාහිර පිරිස් විසින් සිදූ කරන හිංසාකාරික්‍රියාවන්ට ලක් වීමට ද මෙම කණ්ඩායම්වලට සිදුවී ඇත.සතුන් රැගෙන යාමේ දී පවතින නීතිමය බාධාවන් හා සමාජයේ අනෙකුත් පිරිස්වලින් පවතින විරෝධතාව ද මොවුන්ගේ ජීවිකාවට මහත් වූ බලපෑම් එල්ල කරයි.

මෙම සියඹලාගස් වැව තෙලිඟු ගම්මානයේ වාසය කරන බොහෝ අතීත පරම්පරාවන්හි බොහෝ පුද්ගලයන් විවාහයන් ලියාපදිංචි කර නොමැති බැවින් වත්මන් පරපුර ද එම සාම්ප්‍රදායට අනුගත වෙමින් විවාහයන් ලියාපදිංචි නොකරයි.මොවුන්ගේ විවාහයන් තම කුලයන් තුළ සිදුවන බැවින් එය ඔවුනට ගැටළුවක් නොවේ. නමුත් මීළඟ පරම්පරාවට එය ගැටළුවලට මඟ පාදයි.

මේනිසා දරුවන්පාසල් වලට ඇතුලත් කර ගැනීමට නොහැකියාවක් පවතී.මෙහි දරුවන් බොහොමයක් පහ වසර ශිෂ්‍යත්ව විභහගයෙන් පසුව අධ්‍යාපනය නවතා දමයි. ප්‍රධාන වශයෙන්ම ඔවුන් මේ වන

විට අධ්‍යාපනය ලබන පාසල පහ වසරට සීමා වූවක් විමත් වෙනත් පාසල් වලින් මෙම දරුවන් ඇතුළත් කර ගැනීමට දක්වන මැලිකමත් මෙයට හේතු වේ. එමෙන්ම ඔවුන් තුළ අධ්‍යාපනය පිළිබඳ ඇති අවබෝධය ද අල්පය.

ශ්‍රී ලාංකීය පුරවැසියකු සතුව පැවතිය යුතු බොහෝ ලිඛිත සහතිකයක් මොවුන් සතුව නොමැති බැවින් මොවුන්ගෙන් බොහොමයකට ඡන්ද බලය පවා නොමැත . බොහෝ ව්‍යාපෘති තුළින් මෙම ජන කොට්ඨාශයන් හට ස්ථිර වාසස්ථාන ලබා දීම මූලික කරගනු ලැබුවේ ද මොවුන්ගේ ජීවන තත්ත්වය උසස් කර පොදු සමාජය හා මුසු කිරීමේ අරමුණ ඇතිවය.

සියඹලාගස්වැව තෙලිඟු ගම්මානය එයට මහගු නිදසුනකි.නමුත් පදිංචි කිරීම පමණක් සිදුව ඇති අතර වෙනත් කිසිදු පහසුකමක් හෝ පොදු සමාජයට අනුගත කිරීමක් සිදුකර නොමැත .

සෞඛ්‍ය අතින් ගත් කල ද තෙලිඟු ගම්මානය තුළ පසුගිය වසර කීපය තුළ වකුගඩු රෝගය විශාල වශයෙන් දැකගත හැකි විය. කුඩා ළමුන් දන්තරෝග හා චර්ම රෝග වලට ලක්වීම විශාල වශයෙන් දැකගත හැක. පොදු වැසිකිළි පද්ධතියක් ස්ථාපිත කර තිබුණ ද මේ වන තෙක් බොහෝ පුද්ගලයන් එය භාවිත කර නොමැත. ගමටම අවශ්‍ය පානීය ජලය ලබා ගනුයේ නළළිඳක් මගිනි. එහි ජලය ද පානය සඳහා නුසුදුසු වේ. මීට අමතරව ළිං ජලය එදිනෙදා කටයුතු සඳහා යොදා ගනී.

ගමකට මහගු සම්පතක් වන වැව මෙම තෙලිඟු වැසියන්ට තව දුරටත් සම්පතක් නොවන්නේ අසල්වාසී ගම්මාන වලින් වැවෙහි මසුන් ඇල්ලීම හෝ වගාවන් සඳහා ජලය ලබා ගැනීමට කරන බලපෑම නිසාය.මෙම තෙලිඟු වැසියන්ගේ හුරු පුරුදු පැවතුම් සහ ආකල්ප නිසා ද මෙම පිරිස් පොදු සමාජයෙන් ප්‍රතික්ෂේප වී ඇත . එමෙන්ම පොදු සමාජය මොවුන් කෙරෙහි දක්වන ආකල්ප නිසා දතව තවත් මොවුන් විශාල ගැටළු වලට මුහුණ දෙන හුදෙකලා පිරිසක් බවට පත්ව ඇත .

සියඹලාගස්වැව තෙලිඟු ගම්මානයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා ඔවුන්ව බාහිර සමාජය හා මුසු කළ යුතුය. එසේම ඔවුන්ගේ ආර්ථික හා සමාජීය වශයෙන් මෙන්ම ආකල්පීය වශයෙන් වෙනසක් ඇති කළ යුතුය. ශ්‍රී ලාංකීය පුරවැසියකු ලෙස ඔවුනට ලැබිය යුතු වරප්‍රසාද ලැබිය යුතුය අතර ප්‍රධාන වශයෙන්ම ඔවුනට අවශ්‍ය ලිඛිත සහතිකයන් ලබා දීම බාහිර සමාජය තුළ පුරවැසියකු ලෙස නැගී සිටීමට මහෝපකාරී වේ.ශ්‍රී ලංකාව තුළ වයස 18ට අඩු සෑම පුරවැසියකුටම අධ්‍යාපනය ලැබිය යුතුය යන නීතියට අනුකූලව සියඹලාගස් වැව තෙලිඟු ගම්මානයේජිවත් වන දරුවන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය ලබා දීම වටී.

ඒ සඳහා අවශ්‍ය කරන නීත්‍යානුකූල පරිසරය ද මේ තුළින් ගොඩ නැගිය යුතුය. ඊට අමතරව ඡන්ද අයිතිය ලබා ගැනීමට සුදුසුකම් සහිත පිරිසට ඡන්ද බලය ලබා දීමෙන් දේශපාලඥයින්ගේ අවධානය ද මෙම පිරිස් කෙරෙහි ලබා ගැනීම කළ යුතුය.එමෙන්ම මෙම තෙලිඟු ජනයා විසින් කරනු ලබන තම ජීවනෝපාය මාර්ගයන් පවත්වාගෙන යාමට බලධාරීන්ගේ අවසරය ලැබීමත් ඔවුන්ගේ ජීවිකාවට බාහිරින් සිදුවන හිරිහැරයන් වළක්වා ගැනිමට හැකියාව ඇත.ස්ථිර රැකියාවක් හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති මෙම පිරිස් ගත කරනුයේ ඉතාමත් ප්‍රාථමික ආර්ථික රටාවකි.

මෙම තෙලිඟු ගම්මානයේ වෙසෙන තරුණ පිරිසට විකල්ප රැකියා අවස්ථා

පිළිබඳ පුහුණුව ලබා දීමත් හා විකල්ප රැකියා අවස්ථා ලබා දීමෙන් මොවුන්ගේ ආර්ථික කටයුතු පිළිබඳ යම් දියුණුවක් ඇති කිරීමට හැකියාව ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


Wikipedia (2016) Sri Lankan gypsy people. Wikipedia, the free encyclopedia. [online]. Available.

frome:https://en.wikipedia.org/wiki/sri Lankan gypsy people

Wijetunge P. Ahikuntaka:Sri Lankan gypsy clan.

From:http:www.lankalibrary.com/cul/gypsy.htm

Goonaratna T. (2016) Gypsies of Sri Lanka the Ahikuntaka From:http://www.thesundayleader.lk/2016/02/21/gypsies-of-sri-lanka-the ahikuntaka/